# අපේ කාලේ කතන්දර



රසික සූරියආරච්චි

## දරු දුක නොහොත් දරුවන්ගෙන් ලැබෙන දුක

සාමාන්‍යයෙන් "දරු දුක" කියන්නේ දරුවන් වෙනුවෙන් දෙමව්පියන්ගේ හදවතේ ඇති වෙන දුකට ය.

දරුවන්ට ලෙඩක් දුකක් සෑදුණු විට, දරුවන් අනතුරක වැටුණු විට, දරුවන් තාවකාලිකව හෝ තමන්ගෙන් වෙන්ව නිවසෙන් බැහැරව ගිය විට, එසේ නැතිනම් අකාලයේ වියෝ වූ විට දෙමව්පියන් කම්පාවට පත්වීම හෙවත් දෙමව්පියනට "දරු දුක" ඇතිවීම සාමාන්‍ය මනුෂ්‍ය ස්වභාවයකි.
තමන්ගේ ම කියා දරුවන් නැති විවාහක වැඩිහිටියන්ටත්, ඒ නිසාම "දරු දුක" දැනේ.

මට නම් සිතෙන්නේ "දරු දුකේ" තවත් ප්‍රභේදයක් ඇති බවයි. ඒ "දරු දුක" නම්, දරුවන් ගේ නොකටයුතුකම් නිසා, දරුවන්ගෙන් සිදුවෙන කරදර නිසා දෙමව්යන්ට ඇතිවන සැබෑ දුක ය. වේදනාව ය.



මේ ආකාරයේ "දරු දුක" ගැන කියන්නට කතා ඕනෑ තරම් තිබේ. ඉන් මා සිත වඩාත් ම කැලඹූ අත්දැකීම අද මේ අපේ කාලේ කතන්දර අවසාන තීරු ලිපියෙන් විස්තර කිරීමට සිතුවෙමි.

මේ කතාවේ කියවෙන වැඩිහිටි දෙමව්පියන් යුවලට පුතුන් දෙදෙනෙක් සිටිති. ලොකු පුතා රජයේ එක්තරා සේවයකට බැඳී එතැනින් උසස්වීම් ලබා ඒ වන විට ඉහළ තත්වයක රැකියාවක් කරමින් සිටියේ ය. ඔහු විවාහ වී සිය දරු පවුල සමග ජීවත්වෙන්නේ තමන්ට හිමි නිල නිවාසයේ යි.

පුද්ගලික අංශයේ කම්හලක රැකියාව කළ පියා විශ්‍රාම ලැබූ පසු, තමන්ට ලැබුණු අර්ථසාධක මුදලින් ඒ තාක් කල් ඔවුන් ජීවත්ව සිටි කුඩා නිවස තරමක් විශාල කර හොඳින් සාදා ගත්තේ ය. ඒ වන විට විවාහ ගිවිස ගෙන සිටි දෙවෙනි පුත්‍රයා ද මද කලකින් ම විවාහ වී ඔහුගේ බිරිඳ සමග ඒ නිවසේ පදිංචිය ඇරඹී ය.

සිංහල සිරිත අනුව පවුලේ මහ ගෙදර ගේ හිමිවෙන්නේ පවුලේ බාල පුතාට නිසා, ඔහුගේ නමට දෙමව්පියන් සතු ඒ නිවස සහිත පර්චස් දහයක ඉඩම් කැබැල්ල ජීවිත බුත්තිය ඉතුරු කරගෙන පවරා දෙන ලදී. රජයේ උසස් රැකියාවක නිරතුව සිටි ලොකු පුතාට දීමට වෙනත් කිසිදු දේපලක් දෙමව්පියනට නොතිබුණි.

පෞද්ගලික සේවයේ නිරතුව සිටි අයට විශ්‍රාම වැටුපේ නොලැබේ. ජීවත්වීමට ආදායමක් සොයා ගැනීම සඳහා පියා කළේ, ඒ වන විට මව විසින් අරඹා තිබුණු කෑලි රෙදි පමුණුව නම් ප්‍රදේශයෙන් මිලට ගෙන කුඩා ඇඳුම් මැසීමේ ගෘහ කර්මාන්ත ව්‍යාපාරයට අලුතින් මහන මැෂිමක් මිලට ගෙන එකතු වීමයි.

කුඩා නොහොඳ නෝක්කාඩු දුර දිග ගොස්, ටික දිනකින් ම, අලුත් ලේලිය සහ නැන්දම්මා අතර විශාල ප්‍රශ්න, ආරවුල්, අඩදබර ඇති වෙන්නට පටන් ගති.

මා කීමට දන්නේ නැන්දම්මා ගේ පාර්ශවයේ අවනඩුව පමණි. ඇය මට කියූ ආකාරයට ප්‍රශ්න ඔඩු දුවා ගොස්, තව දුරටත් ඔවුනට එකම ගෙදර ඉන්නට, එක කුස්සියේ උයාපහාගෙන කන්නට, තමන්ගේ රෙදි මහන සුළු කර්මාන්තය කරන්නට බැරි තත්වයක් උදාවුණි.

පොඩි පුතා ගත්තේ තමන්ගේ බිරිඳ ගේ පැත්ත ය!

මවට සහ පියාට ජීවත් වීමට වෙනත් ස්ථානයක් නොතිබුණි. ඔවුන් කළේ තමන් ගේ ම නිවසේ එක් පැත්තකින් එහි එක බිත්තියකට ම අල්ලා පොඩි මඩුවක් වැනි කාමරයක් සහ කුස්සියක් ලීයෙන් සාදාගෙන එහි පදිංචියට යෑමයි.
මා දන්නා අයුරින්, ඒ ආකාරයට වෙන් වී ජීවත් වීම ද පහසු වූයේ නැත.

මේ අතරතුර, මේ ජෝඩුව කාලයක් තිස්සේ දන්නා කියන නිවසක හිටි තවත් වයසක ජෝඩුවක ස්වාමි පුරුෂයා මිය ගියේ ය. ඒ වැන්දඹු අම්මාට ඒ නිවසසේ එතැන් සිට තනිවම සිටීමට නොහැකි නිසා, මේ කතානායක ජෝඩුවට එහි විත් ජීවත්වීමට ආරාධනාවක් ලැබුණි.

තමන් ගේ ඉඩමෙන් පිට වී ගොස් අන් සතු ස්ථානයක පදිංචි වීමට, ඒ වැඩිහිටි මව කෙසේ වෙතත් සමහර විට ඒ පියාගේ වැඩි කැමැත්තක් නොතිබෙන්නට ඇත. කෙසේ මුත් අවසානයේ දී මේ දෙපළ තමන්ට ලැබුණු ආරාධනාව පිළිගත් හ. තමන් සතු වස්තුව වූ මහන මැෂින් දෙකද, ඇඳුම් කැඩුම් ස්වල්පය ද රැගෙන ඔවුන් පෙර කී වැන්දඹුවගේ නිවසේ පදිංචියට ගොස් පෙර කළ කර්මාන්තයේ ම නිරත වූහ.

එහෙත් ඒ වැඩි කලකට නොවේ.

වසරක්වත් ගත වීමට පෙර වැඩිහිටි පියා මිය ගියේ ය.

ඒ සමගම දැවැන්ත ප්‍රශ්නයක් නිර්මාණය විය.
මිනිය තබන්නේ, අවමංගල්‍ය උත්සවය පවත්වන්නේ, පාංශුකූලය දෙන්නේ, මළ බත උයන්නේ කොහේද?

මේ තාවකාලික නවාතැනේ ද? තමන් පසුව සාදාගත් මඩුවක් බඳු පැලේ ද? දැන් පොඩි පුතා අයිතිකරගෙන ඉන්න තමන්ගේ නිවසේ ද? නැතිනම් ලොකු පුතා ගේ නිල නිවාසයේ ද? දැඩි ආරක්ෂක කලාපයක තිබුණු ලොකු පුතා ගේ නිල නිවසට මිනිය ගෙන යාමට නොහැකි ය. ලෑලි පැලේ මිනිය තැබුවොත් ලොකු පුතාගේ ලොකු යාළු මිත්‍රයන්ට තියා පොඩි පුතාගේ පොඩි යාළු මිත්‍රයින්ට හෝ මරණය පිළිබඳව ආරංචිය දෙන්නේ කෙසේ ද? තමන් ගේ පියා ඒ ආකාරයේ ලී පැලක ජීවත් වූවා ය යන්න මොන විලිලැජ්ජාවක් ද?

අන්තිමේදී පියා ගේ අවසන් කටයුතු කෙරුණේ මේ නවාතැන් ගත් නිවසේ දී ය.

පුතා ලා, ලේලි ලා, පුතාලාගේ ලොකු ලොකු යාළුවෝ පැමිණ මිය ගිය පියාට අවසන් බුහුමන් දක්වා සිත් සන්තොසින් ආපහු ගිය හ!
දරුවන් විසින් දෙමව්පියන්ට දෙන "දරු දුක" එලෙස වේ!

මා මුලින් කී පරිදි මේ ආකාරයේ දුක්බර " දරු දුක්" කතන්දර එමට තිබේ. ඒ කතා එකින් එක නොකියා, ඒ සියල්ලෙන් ම කියවෙන ලාංකික සමාජයේ නිධන්ගතව ඇති විවිධ සම්ප්‍රදායන් නිසා අවසානයේ සමහර දෙමව්පියන් විහින් ම දුකට පත්වෙන විෂම චක්‍රයේ ඇති බරපතලකම පෙන්වීමට පහත කරුණු සඳහන් කරමි.

1. දරුවන් මෙලොවට බිහි කළා නම්, ඔවුන් බලා කියා ගැනීම, කන්න, බොන්න, අඳින්න දීම, ඔවුන්ට හරි මග පෙන්නා දීම, ඉගෙනුමට ඉඩ සැලසීම දෙමව්පියන් ගේ වගකීමකි.

2. දරුවන් වැඩිහිටි වයසට පත්වූ විට තම තමන්ගේ කාරණා කටයුතු ස්වාධීනව කර ගැනීම දරුවන් ගේ මූලික වගකීමයි. එය දෙමව්පියන් ගේ මූලික යුතුකම්වලින් පරිබාහිර වේ.

3. දෙමව්පියන් ගේ මූලික වගකීම විය යුත්තේ තමන්ට තව දුරටත් ආදායමක් උපයා ගැනීමට නොහැකි අබල දුබල තත්වයට පත් වූ පසු ජීවත්වීම සඳහා මූල්‍ය සම්පාදන සපයා ගැනීමයි.

4. දෙමව්පියන් තමන් ගේ දේපල, උපයාගත් දේ, තමන්ගේ අර්ථසාධක අරමුදල වැනි දේ දරුවන්ට බෙදා දීම තමන් ජීවත්වන කාලය අතරතුර කිසිසේත් ම නොකළ යුතු ය.

5. ඒ වෙනුවට ඔවුන් කළ යුත්තේ තමන් ගේ දේපල තමන් ගේ මරණයෙන් පසු කාට කොයි ලෙස හිමිවිය යුතු ද යන්න ගැන අවසන් කැමති පත්‍රයක් ලියා තැබීමයි.

6. තමන්ගේ දේපල, ධනය තම දරුවන්ට දී, පසුව ඔවුන්ගෙන් තමන්ට සැලකිලි බලාපොරොත්තු වී, ඒ අපේක්ෂා කඩ වී විඳින "දරු දුක" තරම් වෙනත් දුකක් මෙලොව නැතිවා විය යුතු ය.

ප/ලි:
මේ අපේ කාලේ කතන්දර තීරු ලිපි මාලාවේ අවසන් ලිපියයි. වසර තුනකට වැඩි කාලයක් තිස්සේ මේ ලිපි කියවූ ඔබට මගේ ස්තුතිය පිරිනමමි.

**Alpha Academy 2017**
Glen Waverley Classes

Grade 8 , 9 - Mathematics
Grade 8 , 9 - Science
Grade 8 ,9 - English
VCE Chemistry 1 , 2
VCE Biology 1 , 2
Other subjects - Upon request

- All students will be tested before enrolment , placed accordingly in the groups
- Unit Tests for all subjects
- VCE , SAC preparation guidance
- Ongoing updates for parents
- Multiple classes during week , enabling catch-up classes

**To request an application, please text student name, Class and school to 0457908918**